සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2015**

| | | |
|---|---|---|
| කෘෂි තාක්ෂණවේදය I<br>விவசாயத் தொழினுட்பவியல் I<br>Agro Technology I | 18 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

---

**1.** නිෂ්පාදන පද්ධතියක උචිත තාක්ෂණය යොදා ගැනීම පිළිබඳව නිවැරදි ප්‍රකාශය පහත ඒවා අතුරෙන් තෝරන්න.
(1) නිෂ්පාදන පිරිවැය සහ ශ්‍රම භාවිත කාර්යක්ෂමතාව ඉහළ නංවයි.
(2) ඵලදායිතාව සහ නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ නංවයි.
(3) අඩු ශ්‍රම භාවිතය සහ වැඩි යන්ත්‍ර සූත්‍ර භාවිතය තහවුරු කරයි.
(4) නිෂ්පාදනයේ ගුණාත්මය ඉහළ නංවන අතර ජීව කාලය වැඩි කරයි.
(5) නිෂ්පාදනයේ පෙනුම හා වයනය වැඩි දියුණු කරයි.

**2.** බැංකුකරණයේ දී යොදා ගැනෙන තාක්ෂණ අංග කිහිපයක් පහත දැක්වේ.
A - මුදල් යැවීම (Money transfer) B - අන්තර්ජාල බැංකුකරණය
C - ණයපත (Credit card) D - හරපත (Debit card)
ඉහත නව තාක්ෂණ භාවිතයන් අතුරෙන් සාර්ථක ව්‍යාපාර කළමනාකරණයක දී, භාණ්ඩ විකිණීම හා මිලදී ගැනීමේ දී භාවිත කරනුයේ,
(1) A, B හා C පමණි. (2) A, B හා D පමණි. (3) A, C හා D පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D සියල්ල ම ය.

**3.** අධිපෝෂණය හා සෘජු සම්බන්ධතාවක් **නොදක්වන** නිධන්ගත (Chronic) රෝගී තත්ත්වයක් වන්නේ,
(1) පිළිකාව ය. (2) හෘදයාබාධය ය. (3) ආඝාතය ය.
(4) දියවැඩියාව ය. (5) අස්ථි භංගුරතාව (Osteoporosis) ය.

**4.** පුද්ගලයකුගේ දේහ ස්කන්ධ දර්ශකය (BMI) වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,
(1) $\frac{\text{දේහ ස්කන්ධය (kg)}}{\text{දේහයේ උස (cm)}}$ ලෙසිනි. (2) $\frac{\text{දේහ ස්කන්ධය (kg)}}{\text{දේහයේ උස}^2\text{ (m)}}$ ලෙසිනි.
(3) $\frac{\text{දේහ ස්කන්ධය}^2\text{ (kg)}}{\text{දේහයේ උස (m)}}$ ලෙසිනි. (4) $\frac{\text{දේහ ස්කන්ධය}^2\text{ (kg)}}{\text{දේහයේ උස (cm)}}$ ලෙසිනි.
(5) $\frac{\text{දේහ ස්කන්ධය (kg)}}{\text{දේහයේ උස}^2\text{ (cm)}}$ ලෙසිනි.

**5.** ආහාරවල ජෛව රසායනික නරක්වීම මත පදනම් වූ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.
A - ආහාර නරක්වීම සඳහා එන්සයිමීය ප්‍රතික්‍රියා හේතුවිය හැකි ය.
B - ආහාරයක දුඹුරුවීම එන්සයිමීය ප්‍රතික්‍රියාවක් ලෙස පැහැදිලි කළ හැකි ය.
ඉහත ප්‍රකාශ අතුරෙන්,
(1) A පමණක් සත්‍ය වේ. (2) B පමණක් සත්‍ය වේ.
(3) A හා B දෙකම සත්‍ය වේ. (4) A සත්‍ය වන අතර B මගින් එය වඩාත් පැහැදිලි කරයි.
(5) B සත්‍ය වන අතර A මගින් එය වඩාත් පැහැදිලි කරයි.

[ දෙවැනි පිටුව බලන්න.

EXAMMOOD.LK EXAMMOOD.LK

6. මස් නරක්වීම සඳහා වඩාත් සුලභව හේතුවන ක්ෂුද්‍රජීවියා වන්නේ,
(1) *Clostridium botulinum* ය.
(2) *Aspergillus flavus* ය.
(3) *Aspergillus oryzae* ය.
(4) *Lactobacillus bulgaricus* ය.
(5) *Lactobacillus thermophilus* ය.


7. රටක ආහාර සුරක්ෂිතතාවට (Food security) බලපාන ක්‍රියාවලි ලෙස ශිෂ්‍යයකු පහත දෑ ලැයිස්තුගත කර තිබුණි.
A - ආහාර නිෂ්පාදනය වැඩි කිරීම
B - පසු අස්වනු හානිය අඩු කිරීම
C - ආහාර විවිධාංගීකරණය
D - ආහාර පරිරක්ෂණය
ඉහත සාධක අතුරෙන් ආහාර සුරක්ෂිතතාවට සෘජුව දායක වන්නේ,
(1) A හා B පමණි.
(2) A හා C පමණි.
(3) A, B හා C පමණි.
(4) B, C හා D පමණි.
(5) A, B, C හා D සියල්ල ම ය.

8. ශ්‍රී ලංකාවේ මහා පාංශු බාණ්ඩ, කෘෂි දේශගුණික කලාප සහ මධ්‍යන්‍ය වාර්ෂික වර්ෂාපතනය මත පදනම් වූ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - ශ්‍රී ලංකාවේ මහා පාංශු බාණ්ඩ 14 ක් හඳුනා ගෙන ඇත.
B - වර්ෂාපතනයේ ව්‍යාප්තිය පදනම් කර ගනිමින් ශ්‍රී ලංකාව කෘෂි දේශගුණික කලාප තුනකට බෙදා ඇත.
C - ශ්‍රී ලංකාවේ වියළි කලාපයට මැයි සිට සැප්තැම්බර් දක්වා පැහැදිලි වියළි කාලයක් සහිතව 1,750 mm ට අඩු වූ මධ්‍යන්‍ය වාර්ෂික වර්ෂාපතනයක් ලැබේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,
(1) A පමණි.
(2) B පමණි.
(3) A හා B පමණි.
(4) A හා C පමණි.
(5) B හා C පමණි.

9. ශ්‍රී ලංකාවේ මැදරට උච්චත්වය මුහුදු මට්ටමේ සිට,
(1) 0 - 50 m දක්වා වේ.
(2) 50 - 100 m දක්වා වේ.
(3) 100 - 300 m දක්වා වේ.
(4) 300 - 900 m දක්වා වේ.
(5) 900 - 1,500 m දක්වා වේ.

● 10 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා දී ඇති රූප සටහන භාවිත කරන්න.

10. රූපයේ දක්වා ඇති ශාක ප්‍රචාරණ ක්‍රමය වන්නේ,
(1) බද්ධ කිරීම (Budding) ය.
(2) පැති බද්ධය ය.
(3) පතුරු (Veneer) බද්ධය ය.
(4) ආරුක්කු බද්ධය ය.
(5) කුඤ්ඤ බද්ධය ය.



11. පාතෙනෝෆලනය වඩාත් හොඳින් අර්ථ දැක්විය හැක්කේ,
(1) බීජ රහිත ඵල හටගැනීම කෘත්‍රිමව උත්තේජනය කිරීමක් ලෙස ය.
(2) ඩිම්බ සංසේචනයෙන් තොර වූ ඵල හට ගැනීම ස්වාභාවික හෝ කෘත්‍රිමව උත්තේජනය කිරීමක් ලෙස ය.
(3) සංසේචනයෙන් තොරව බිහි වූ කලල විකසනය හා වර්ධනය වීමක් ලෙස ය.
(4) බීජ රහිත ඵල නිෂ්පාදනය සිදු කෙරෙන ලිංගික ප්‍රජනන තාක්ෂණ ක්‍රමයක් ලෙස ය.
(5) බීජ රහිත ඵල නිෂ්පාදනය සිදු කෙරෙන අලිංගික ප්‍රජනන තාක්ෂණ ක්‍රමයක් ලෙස ය.

12. පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ශ්‍රී ලංකාවේ බීජ සිටුවීමට පෙර බීජ ප්‍රතිකාරකයක් ලෙස කෘමිනාශක සුලභව භාවිත වේ.
(2) ලීක්ස් ශාකයේ මුල්, වර්ධක ප්‍රචාරණ ද්‍රව්‍යයක් ලෙස භාවිත කෙරේ.
(3) බීජ මගින් ප්‍රචාරණය පරිසර පද්ධතියක ජෛව විවිධත්වය වැඩි කිරීමට හේතු වේ.
(4) වර්ධක ප්‍රචාරණය මගින් ශාක ගහනයක ජාන විවිධත්වය වැඩි වේ.
(5) බීජ සිටුවීමට පෙර ඒවායේ සුප්තතාව ඉවත් කිරීමට කැප්ටාන් රසායනිකය භාවිත කෙරේ.

13. පහත දැක්වෙන්නේ *Aegle marmelos* (බෙලි) ශාකයේ කොටස් කිහිපයකි.
A - කඳේ පවතින කටු
B - මුල්
C - කොළ
D - ඵල
E - පොතු
ඉහත කොටස් අතුරෙන් ඖෂධීය භාවිතයට යොදා **නොගන්නේ**,
(1) A පමණි.
(2) B පමණි.
(3) A හා E පමණි.
(4) C හා E පමණි.
(5) B, D හා E පමණි.

EXAMMOOD.LK

**14.** ඉඟුරු පිළිබඳව **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) වමනයට ප්‍රතිකාර කිරීම සඳහා භාවිත කරයි.
(2) උදර වේදනාවට ප්‍රතිකාර කිරීම සඳහා භාවිත කරයි.
(3) කැස්සට ප්‍රතිකාර කිරීම සඳහා භාවිත කරයි.
(4) ආහාර විෂවීමට ප්‍රතිකාර කිරීම සඳහා භාවිත කරයි.
(5) ඇදුම රෝගයට ප්‍රතිකාර කිරීම සඳහා භාවිත කරයි.

**15.** පහත සඳහන් රෝග සලකන්න.

A - පණු රෝග
B - අක්ෂි රෝග
C - චර්ම රෝග
D - හෘද රෝග
E - වකුගඩු රෝග

ඉහත රෝග අතුරෙන් මුරුංගා ශාකයේ (*Moringa oleifera*) කොටස්, ප්‍රතිකාර සඳහා යොදා ගනු ලබන රෝග වන්නේ,

(1) A, B හා C පමණි.
(2) A, B හා D පමණි.
(3) A, C හා E පමණි.
(4) B, C හා D පමණි.
(5) C, D හා E පමණි.

**16.** පරිසර පද්ධති පාදක කළමනාකරණය (EBM) යනු,

(1) ආර්ථික, පාරිසරික හා ව්‍යාපාරික අරමුණු ඒකාබද්ධ කිරීම සඳහා යොදා ගනු ලබන පිවිසුමකි.
(2) පාරිසරික, සාමාජීය හා ආර්ථික අරමුණු ඒකාබද්ධ කිරීම සඳහා යොදා ගනු ලබන පිවිසුමකි.
(3) පාරිසරික, සාමාජීය හා කෘෂිකාර්මික අරමුණු ඒකාබද්ධ කිරීම සඳහා යොදා ගනු ලබන පිවිසුමකි.
(4) සමාජීය, ව්‍යාපාරික හා ආර්ථික අරමුණු ඒකාබද්ධ කිරීම සඳහා යොදා ගනු ලබන පිවිසුමකි.
(5) කෘෂිකාර්මික, සමාජීය හා ආර්ථික අරමුණු ඒකාබද්ධ කිරීම සඳහා යොදා ගනු ලබන පිවිසුමකි.

**17.** පහසුවෙන් නරක්වන ආහාර පහළ උෂ්ණත්වයක ගබඩා කිරීමේ ප්‍රධානතම හේතුව වන්නේ,

(1) ජල හානි අවම කිරීමට ය.
(2) මෘදු පටකවල ශ්වසනය වැඩිකිරීමට ය.
(3) ජීව්‍යතාව පවත්වා ගැනීමට ය.
(4) ක්ෂුද්‍රජීවී සහ කායික ක්‍රියා අවම කිරීමට ය.
(5) වර්ණය වැඩි දියුණු කිරීමට ය.

**18.** වියළි මිරිස් මත දිලීර පැවතීමට මූලික හේතුව වන්නේ,

(1) නොමේරූ අවස්ථාවේ අස්වනු නෙළා ගැනීම ය.
(2) නුසුදුසු වියළන තත්ත්ව නිසා ය.
(3) වියළි ස්ථානවල ගබඩා කරන නිසා ය.
(4) අඳුරු ස්ථානවල ගබඩා කරන නිසා ය.
(5) සූර්යාලෝකයේ වියළීම නිසා ය.

**19.** ජෛව තාක්ෂණය පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.

A - නූතන විද්‍යාවේ වර්ධනය ජෛව තාක්ෂණය මත පදනම් වී ඇත.
B - සාම්ප්‍රදායික ක්‍රියාකාරකම් තුළ ජෛව තාක්ෂණික යෙදුම් හඳුනාගත හැකි ය.
C - ජෛව තාක්ෂණය යනු මෑත කාලයේ දී වර්ධනය වූ වැදගත් තාක්ෂණයක් වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A හා B පමණි. (5) A හා C පමණි.

**20.** හොඳ විභවයක් ඇති ව්‍යවසායකයෙක්,

(1) සැමවිට ම ඉහළ අවදානම් දැරීමට සූදානම් ය.
(2) කිසිවිටකත් ඉහළ අවදානමක් නොගනියි.
(3) අවදානමක් ගනු ලබන අතර ඒවා සැලකිලිමත් ව කළමනාකරණය කරයි.
(4) අවදානම් ඉවත් කිරීමට උත්සාහ දරන අතර පාඩුව අවම කරනු ලබයි.
(5) බාහිර සහායකින් තොරව අවදානම කළමනාකරණය කරයි.

**21.** ව්‍යවසායකත්වය සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.


A - හොඳ ව්‍යවසායකයකු නම්‍යශීලී, නිදහස් හා කාර්යය කෙරෙ කැපවීමකින් යුතුව කටයුතු කරයි.
B - ව්‍යවසායකයාගේ සාර්ථකත්වය රඳා පවතිනේ ආරම්භක ප්‍රාග්ධනය මත ය.
C - අන්‍යයන් වෙත වගකීම් පැවරීම ව්‍යවසායකයකුගේ නායකත්ව ලක්ෂණ පිළිබිඹු කරයි.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A හා B පමණි. (5) A හා C පමණි.

**22.** තේ ඇසුරුම් ව්‍යාපාරයක විවිධ ස්ථරවල සේවය කරන සේවකයන් පහත පිරමීඩය මගින් දක්වා ඇත.

A හා B මගින් නිරූපණය කෙරෙන ස්ථර විය හැක්කේ පිළිවෙළින්,




(1) හිමිකරු හා අධ්‍යක්ෂ වේ.
(2) අධ්‍යක්ෂ හා සහකාර කළමනාකරු වේ.
(3) සහකාර කළමනාකරු හා පරීක්ෂක වේ.
(4) පරීක්ෂක හා වැඩපාලක (Foreman) වේ.
(5) ජ්‍යෙෂ්ඨ පරීක්ෂක හා කනිෂ්ඨ පරීක්ෂක වේ.

EXAMMOOD.LK


**23.** කුඩා ව්‍යාපාරයක ශේෂ පත්‍රයක් (Balance sheet) සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු වන්නේ,
(1) ආදායම් සහ වියදම් ය.
(2) ආදායම්, වියදම් සහ ලාභය ය.
(3) මූලික ප්‍රාග්ධනය සහ දළ ආදායම ය.
(4) වත්කම් සහ වගකීම් ය.
(5) වත්කම්, වගකීම් සහ ලාභය ය.

**24.** නැප්සැක් ඉසිනයක් මගින් කෘෂි රසායන ද්‍රව්‍ය යෙදීමේ දී සුළඟේ දිශාව වැදගත් වන්නේ, එය,
(1) බිඳිතිවල ප්‍රමාණය සහ යෙදවුම් වේගය අඩු කරන නිසා ය.
(2) යන්ත්‍රය ක්‍රියාකරවන්නාට ඇති අවදානම අවම කිරීම සඳහා චලන දිශාව තීරණය කිරීම නිසා ය.
(3) යොදන රසායන ද්‍රව්‍යයේ මාත්‍රාව වැඩි කරන නිසා ය.
(4) ශාක මත රසායනික ද්‍රව්‍ය යෙදිය යුතු ප්‍රමාණය අඩු කරන නිසා ය.
(5) දියර යෙදීමට උදවු නොවන නිසා ය.

**25.** ශ්‍රී ලාංකේය වර්ගයේ ජීවවායු ජනකයක ඇති සීමාකාරී සාධකයක් වන්නේ,
(1) අනෙකුත් ජීවවායු ජනක හා සැසඳීමේ දී ජීව වායුවේ අඩු ජල ප්‍රමාණයක් අන්තර්ගත වීම ය.
(2) පිදුරු ජීරණය සඳහා පමණක් සීමා වී තිබීම ය.
(3) ඉදිකිරීම සඳහා පුහුණු ශ්‍රමය අවශ්‍ය වීම ය.
(4) නැවත පිරවීමේ අදියරේ දී ජීව වායුව නිෂ්පාදනය නැවතීම ය.
(5) වායු කාන්දු වීමට ඉහළ නැඹුරුතාවක් පැවතීම ය.


**26.** ගොවිපොළ ව්‍යුහ සඳහා බම්බු භාවිතය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) කොන්ක්‍රීට්වලට වඩා ශක්තිය අඩු බැවින් සුදුසු නොවේ.
(2) නිවැරදි කාර්යය සඳහා යොදා ගන්නේ නම්, සුදුසු තාක්ෂණයක් ලෙස සැලකිය හැකි ය.
(3) GI පයිප්ප සඳහා ආදේශකයක් ලෙස යොදා ගතහොත් පිරිවැය අධික වේ.
(4) ඉක්මනින් දිරාපත් වන බැවින් නිර්දේශ නොකෙරේ.
(5) පරිසරයට බලපෑම් ඇති කරන බැවින් ප්‍රවර්ධනය නොකෙරේ.

**27.** පහත දැක්වෙන මෙවලම භාවිත වන්නේ,



(1) හොඳින් තද වූ පසක කඨෝර ස්තරය (Hard pan) බිඳ දැමීමට ය.
(2) රෝද දෙකේ ට්‍රැක්ටරයක් සමග බිම් සැකසීමට ය.
(3) රෝද හතරේ ට්‍රැක්ටරයක් සමග උස් බිම් වගාවේ ප්‍රාථමික බිම් සැකසීමට ය.
(4) රෝද හතරේ ට්‍රැක්ටරයක් සමග පහත් බිම් වගාවේ බිම් සැකසීමට ය.
(5) වැවිලි බෝගවල අතුරුයත් ගෑමට ය.

**28.** පහත රූප සටහන මගින් මෙවලමක් සවි කරන ලද රෝද දෙකේ ට්‍රැක්ටරයක් දැක්වේ. රෝද දෙකේ ට්‍රැක්ටරයට සවි කරන ලද මෙවලම වන්නේ,



(1) තැටි නගුලකි.
(2) රොටවේටරයකි.
(3) කොකු නගුලකි.
(4) හැඩ ලෑලි නගුලකි (Mold board plough).
(5) වතුර පොම්පයකි.

**29.** පස් අංශුවල මධ්‍යන්‍ය විශාලත්වය අඩුවීම මගින්,
(1) පසෙහි පෝෂක රඳවා තබා ගැනීමේ හැකියාව අඩු කරයි.
(2) කාන්දු වීම දියුණු කරයි.
(3) ජලය රඳවා තබා ගැනීමේ හැකියාව වැඩි කරයි.
(4) වාතනය අඩු කරයි.
(5) කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය වැඩි කරයි.



EXAMMOOD.LK EXAMMOOD.LK

**30.** පසක ජලය රඳවා තබා ගැනීමේ හැකියාව තීරණය වනුයේ,
(1) වාෂ්පීකරණය, උත්ස්වේදනය සහ උර්ධවපාතනය මත ය.
(2) කාන්දුවීමේ ධාරිතාව, ජලය රඳවා ගැනීමේ ධාරිතාව සහ වාෂ්පීකරණයෙන් හානිවන ජල ප්‍රමාණය මත ය.
(3) ජල සැපයුම, කාන්දුවීම සහ ලවණකරණය මත ය.
(4) පසෙහි ගැඹුර, අංශුවල ප්‍රමාණය සහ කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය මත ය.
(5) කාන්දුවීමේ ධාරිතාව, ජලය රඳා ගැනීමේ ධාරිතාව සහ වාෂ්පීකරණයෙන් හානිවන ජල ප්‍රමාණය මත ය.

**31.** වැස්සීම (Percolation) මගින් වන හානිය වැඩි වනුයේ,
(1) වැඩි කාබනික ද්‍රව්‍ය ප්‍රමාණයක් ඇති පසක ය.
(2) වැඩි මැටි ප්‍රමාණයක් ඇති පසක ය.
(3) ලිහිල් පසකට වඩා තද පසක ය.
(4) වැලි සහිත පසක ය.
(5) ලෝම පසක ය.

**32.** ජල සැපයුම් අතර කාල පරාසය (Interval) වැඩි කරනුයේ,
(1) වැසි කාලවල දී ය.
(2) අධික සුළං ඇති කාලවල දී ය.
(3) වැලි සහිත පස් සඳහා ය.
(4) එක් ජල සැපයුම් වාරයක දී අඩු ජල ප්‍රමාණයක් භාවිත කළ විට දී ය.
(5) දහවල් කාලයේ ජලය සැපයීමේ දී ය.

**33.** පිටාර ජල සම්පාදනයේ දී වඩාත් ම වැදගත් සාධකය වන්නේ,
(1) මූල මණ්ඩලයට යටින් ජලය රඳවා තබා ගැනීම සඳහා කඨෝර ස්තරයක් තිබීම ය.
(2) වාරි ජලයේ ගුණාත්මය ය.
(3) වාරි ජලය සැපයීම සඳහා ජලජ ශාක පමණක් තිබීම ය.
(4) මූල පද්ධතියට හානිවීම වැලැක්වීම සඳහා ඉක්මනින් ජලය බැස යාම ට පසට ඇති හැකියාව ය.
(5) භූමිය රැළි සහිත වීම ය.

**34.** පහත දෑ අතුරෙන් ජෛවීය නයිට්‍රජන් තිර කිරීම සඳහා අත්‍යවශ්‍ය මූලද්‍රව්‍යය වන්නේ,
(1) සල්ෆර් ය.
(2) සින්ක් ය.
(3) පොටෑසියම් ය.
(4) මොලිබ්ඩිනම් ය.
(5) නයිට්‍රජන් ය.

**35.** ශාකවලට මැන්ගනීස් අවශ්‍ය වන්නේ,
(1) හරිතප්‍රද සංශ්ලේෂණය සඳහා ය.
(2) නියුක්ලෙයික් අම්ල සංශ්ලේෂණය සඳහා ය.
(3) ශාක සෛල සෑදීම සඳහා ය.
(4) ජලය ප්‍රභාවිච්ඡේදනය කිරීම සඳහා ය.
(5) මුල්වල ශ්වසනය සඳහා ය.

**36.** ප්‍රභාසංස්ලේෂණය සිදුවන ස්ථානයේ සිට ශාකයේ අනෙකුත් කොටස් දක්වා සීනි පරිවහනය වන ප්‍රධාන ආකාරය වන්නේ,
(1) ග්ලිසරැල්ඩිහයිඩ්-3-පොස්ෆේට් ලෙස ය.
(2) ග්ලූකෝස් ලෙස ය.
(3) ෆ්‍රක්ටෝස් ලෙස ය.
(4) රිබියුලෝස් 1,5-බිස් පොස්ෆේට් ලෙස ය.
(5) සුක්‍රෝස් ලෙස ය.

**37.** භූ දර්ශනයක් කලාත්මක ලෙස සැකසීමේ දී සැලකිය යුතු අංග කිහිපයක් පහත දැක්වේ.
A - වර්ණය
B - වයනය
C - සමස්තය (Mass)
D - ආලෝකය සහ සෙවණ
ඉහත දේ අතුරින් වඩාත් වැදගත් අංග වන්නේ,
(1) A, B, C පමණි.
(2) A, B, D පමණි.
(3) A, C, D පමණි.
(4) B, C, D පමණි.
(5) A, B, C හා D සියල්ල ම ය.

**38.** දිලීර මූල යනු,
(1) මුල් සහ සමහර දිලීර අතර ඇති පරපෝෂී සම්බන්ධතාවකි.
(2) දිලීර සහ සමහර උසස් ශාකවල මුල් අතර ඇති සහජීවී සම්බන්ධතාවකි.
(3) කුඹින් සහ සමහර උසස් ශාකවල මුල් අතර ඇති සම්බන්ධතාවකි.
(4) ඇල්ගී සහ සමහර දිලීර අතර ඇති සහජීවී සම්බන්ධතාවකි.
(5) වල් පැළෑටි සහ සමහර උසස් ශාකවල මුල් අතර ඇති පරපෝෂී සම්න්ධතාවකි.

**39.** දිලීරවල සෛල බිත්තියේ අඩංගු වන්නේ,
(1) සෙලියුලෝස් ය.
(2) හෙමිසෙලියුලෝස් ය.
(3) පෙක්ටින් ය.
(4) කයිටින් ය.
(5) පිෂ්ටය ය.

**40.** පලිබෝධනාශක ලේබලයක 'EC' යනුවෙන් අදහස් කරන්නේ,
(1) Electrical Conductivity ය.
(2) Emulsifiable Concentrate ය.
(3) Effective Concentration ය.
(4) European Community ය.
(5) Enquiry Clause ය.

**41.** 2015 සිට ශ්‍රී ලංකාවට ආනයනය කිරීම තහනම් කළ වල් නාශකයක් වන්නේ,
(1) පැරක්වාට් ය.
(2) ග්ලයිෆොසේට් ය.
(3) ග්ලුෆොසිනේට් ඇමෝනියම් ය.
(4) කාර්බොෆියුරාන් ය.
(5) මොනොක්‍රොටොෆොස් ය.

**42.** ආරක්ෂිත කුටීර තුළ බෝග වගා කිරීමේ ප්‍රධාන වාසි අතුරෙන් එකක් වනුයේ,
(1) අඩු නිෂ්පාදන පිරිවැය ය.
(2) ඒකක ක්ෂේත්‍ර ඵලයකින් වැඩි නිෂ්පාදනයක් ලැබීම ය.
(3) අඩු යෙදවුම් ය.
(4) අඩු ප්‍රාග්ධන පිරිවැය ය.
(5) අඩු මෙහෙයුම් වියදම ය.

**43.** ආරක්ෂිත කුටීර තුළ බෝග වගාව පරිසර හිතකාමී වන්නේ, ඒවා තුළ
(1) දෙමුහුම් විශේෂ භාවිතය නිසා ය.
(2) කෘෂිරසායන අඩුවෙන් භාවිත කිරීම ය.
(3) කාබනික පොහොර පමණක් භාවිත කිරීම ය.
(4) කෘෂිරසායන යොදා නොගැනීම ය.
(5) ස්වාභාවික පරිසරයෙන් මදක් හුදකලා වී තිබීම ය.

**44.** 2014 දී ශ්‍රී ලංකාවේ මල් වගා නිෂ්පාදන වැඩි ම ප්‍රමාණයක් ආනයනය කළ රට වන්නේ,
(1) නෙදර්ලන්තය ය.
(2) ජපානය ය.
(3) එක්සත් රාජධානිය ය.
(4) සවුදි අරාබිය ය.
(5) ජර්මනිය ය.

**45.** පහත දැක්වෙන්නේ ශාක පටක රෝපණය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි.
A - MS යනු වෙළෙඳපොළ දක්නට ඇති එක වර්ධක මාධ්‍යයකි
B - ඇල්බට් ද්‍රාවණය භාවිත කර වර්ධක මාධ්‍යයක් දේශීයව නිපදවිය හැකි ය.
C - ප්‍රාග්ධන වියදම අඩු ය.
D - වයිරස්වලින් තොර රෝපණ ද්‍රව්‍ය නිපදවිය හැකි ය.
E - පුහුණු ශ්‍රමය අවශ්‍ය ය.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A, B, C හා D පමණි.
(2) A, B, C හා E පමණි.
(3) A, B, D හා E පමණි.
(4) A, C, D හා E පමණි.
(5) B, C, D හා E පමණි.

**46.** පහත ප්‍රකාශ සලකන්න.
A - තන්තු අධික සත්ත්ව ආහාර ජීරණය කළ හැක්කේ රෝමාන්තිකයන්ට පමණි.
B - සත්ත්ව ආහාරවල ශක්ති පරිපූරක ලෙස කාබෝහයිඩ්‍රේට සහ මේද ප්‍රභව භාවිත කළ ද, සතුන්හට ප්‍රෝටීන පරිපූරක ආධාරයෙන් ද ශක්තිය ලබා ගැනීමේ හැකියාව ඇත.
C - ශාක ප්‍රෝටීනවලට සාපේක්ෂ ව සත්ත්ව ප්‍රෝටීනවල වැඩිපුර අත්‍යවශ්‍ය ඇමිනෝ අම්ල අන්තර්ගත ව ඇත.
D - දෙමුහුම් නේපියර් හොඳ ගුණාත්මයෙන් යුත් පෝෂ්‍ය තෘණ වර්ගයකි.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A හා B පමණි.
(2) B හා C පමණි.
(3) C හා D පමණි.
(4) A, B හා C පමණි.
(5) B, C හා D පමණි.

**47.** සතුන්ට අත්‍යවශ්‍ය ප්‍රධාන මූලද්‍රව්‍ය සඳහා උදාහරණ කිහිපයක් වනුයේ,
(1) Ca, Mg, K හා Cd ය.
(2) N, P, K හා Ca ය.
(3) Ca, P, K හා Na ය.
(4) Ca, P, S හා Fe ය.
(5) Ca, P, Cr හා Zn ය.

**48.** පහත ප්‍රකාශ අතුරෙන්, වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) බිත්තරයේ හැඩය සහ බිත්තර කටුවේ වර්ණය, බිත්තරයක hatchability කෙරෙහි ඍජුව බලපායි.
(2) රැක්කවීම සඳහා බිත්තර, රක්කවනයක තැබීමට පෙර දින 3 - 4 ක් පමණ ගබඩා කළ යුතු ය.
(3) බිත්තරයෙන් පිටතට පැමිණි වහාම කුකුළු පැටවුන් සඳහා ආහාර සහ ජලය සැපයිය යුතු ය.
(4) කෘත්‍රිම රක්කවනයක් යොදා ගැනීම වඩාත් සාර්ථක වනුයේ රැක්කවීම සඳහා අවශ්‍ය සාධක පහසුවෙන් පාලනය කළ හැකි බැවිනි.
(5) බිත්තර රැක්කවීමේ අවසාන දිනයේ දී ඒවා ඇසුරුම් කුටීරයේ සිට රැක්කවීමේ කුටීරයට මාරු කළ යුතු ය.

**49.** කිරි ගවයන්ගේ මද සමායෝජනය,
(1) ගොවිපොළක කිරි නිෂ්පාදනය වැඩිවීමට ඉවහල් වේ.
(2) ගව රැලේ ඒකාකාරිත්වය වැඩි කරයි.
(3) ගොවිපොළේ අඛණ්ඩ කිරි නිෂ්පාදනය පහසු කරයි.
(4) සතුන්ගේ සෞඛ්‍ය තත්ත්වය දියුණු කරයි.
(5) සතුන්ගේ අභිජනන කාර්යක්ෂමතාව වැඩි දියුණු කරයි.

**50.** කිරි පැස්ටරීකරණය කිරීම සඳහා යොදා ගන්නා උෂ්ණත්ව සහ කාල සංයෝජනය වන්නේ,
(1) 72 °C සහ විනාඩි 30 ය.
(2) 63 °C සහ විනාඩි 30 ය.
(3) 63 °C සහ තත්පර 15 ය.
(4) 150 °C සහ තත්පර 15 ය.
(5) 75 °C සහ තත්පර 15 ය.

* * *

EXAMMOOD.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

කෘෂි තාක්ෂණවේදය II
விவசாயத் தொழினுட்பவியல் II
Agro Technology II

**18 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

විභාග අංකය : ..................................

**උපදෙස් :**

※ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **09** කින් සහ ප්‍රශ්න **10** කින් සමන්විත වේ.

※ මෙම ප්‍රශ්න පත්‍රය **A, B** හා **C** යනුවෙන් කොටස් **තුනකින්** සමන්විත වන අතර කොටස් **තුනට ම** නියමිත කාලය **පැය තුනකි.**

**A කොටස — ව්‍යුහගත රචනා (පිටු අංක 2 - 8)**

※ ප්‍රශ්න **හතරට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.

※ ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු **නො වන** බව ද සලකන්න.

**B කොටස සහ C කොටස — රචනා (පිටු අංක 9)**

※ එක් එක් කොටසින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A, B** සහ **C** කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ **A** කොටස උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.

※ ප්‍රශ්න පත්‍රයේ **B** හා **C** කොටස් පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| C | 8 | |
| | 9 | |
| | 10 | |
| එකතුව | | |
| ප්‍රතිශතය | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

**සංකේත අංකය**

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| ලකුණු පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය කළේ | |

EXAMMOOD.LK

මෙම තීරයේ කිසිවක් නො ලියන්න.

**A කොටස - ව්‍යුහගත රචනා**

**සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.

(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය **10** කි.)

**1.** (A) මෘදු තාක්ෂණය විවිධ සංඝටක මත පදනම් වී ඇත. එවැනි සංඝටක **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

(B) ව්‍යාපාර කළමණාකරණය සඳහා තොරතුරු ලබා ගැනීමට අන්තර්ජාලය භාවිත කළ හැකි ආකාර **දෙකක්** දක්වන්න.

(1) ..............................

(2) ..............................

(C) පහත එක් එක් පෝෂක ප්‍රමාණවත් පරිදි ශරීරයට ලබා **නොගැනීම** හේතුවෙන් ඇතිවිය හැකි රෝගී තත්ත්වයක් බැගින් සඳහන් කරන්න.

| **පෝෂකය** | **රෝගී තත්ත්වය** |
|---|---|
| (i) විටමින් A | .............................. |
| (ii) යකඩ | .............................. |
| (iii) අයඩීන් | .............................. |
| (iv) කැල්සියම් | .............................. |

(D) ආහාර නරක්වීම බහු සාධක ක්‍රියාවලියක් ලෙස පැහැදිලි කළ හැකි ය.

(i) ආහාරයක රසායනික නරක්වීම කෙරෙහි සෘජුව ම සම්බන්ධ සාධක **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

(ii) අපිරිසිදු තත්ත්ව යටතේ ආහාර නරක්වීම කෙරෙහි සෘජුව බලපෑ හැකි තත්ත්ව **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

(E) ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාව (Food security) ඉහළ නැංවිය හැකි මාර්ග **තුනක්** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(F) ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප වර්ගීකරණය සඳහා යොදා ගන්නා ලද සාධක **හතරක්** ලැයිස්තුගත කරන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

EXAMMOOD.LK


මේ තීරයේ කිසිවක් නො ලියන්න.

3041

(G) එක් එක් රූප සටහන්වල දක්වා ඇති වර්ධක ප්‍රචාරණ ක්‍රමය නම්කර, එම ක්‍රමය යොදාගත හැකි බෝගයක් සඳහා උදාහරණය බැගින් සඳහන් කරන්න.


(i) ක්‍රමය : ..........................................

බෝගය : ..........................................




(ii) ක්‍රමය : ..........................................

බෝගය : ..........................................



(iii) ක්‍රමය : ..........................................

බෝගය : ..........................................



**2.** (A) ශ්‍රී ලංකාවේ දැකිය හැකි සංවේදී ජලජ පරිසර පද්ධති **තුනක්** නම් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(3) ..........................................................................................................

(B) ජලජ පද්ධතියක තිරසාර බවට බලපාන තර්ජන **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(C) මත්ස්‍ය ආශ්‍රිත නිෂ්පාදනවල පසු අස්වනු හානි අඩුකිරීම සඳහා යොදා ගැනෙන වැදගත් ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(D) ධාන්‍යවල පසු අස්වනු හානි අවම කරගැනීම සඳහා යොදා ගත හැකි තාක්ෂණික ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(E) ජාන විකරණය කරන ලද බෝගවල වාසි **දෙකක්** සහ අවාසි **දෙකක්** දක්වන්න.

(i) වාසි

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(ii) අවාසි

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

EXAMMOOD.LK

[ හතරවැනි පිටුව බලන්න.

මේ තීරයේ කිසිවක් නො ලියන්න.

(F) කිරි සහ ප්ලාස්ටික් බඳුන්වල මිල ඉහළයාම, කුඩා පරිමාණ යෝගට් නිෂ්පාදන ව්‍යාපාරයක් කෙරෙහි අහිතකර ලෙස බලපෑම් එල්ල කරන ලදී. ව්‍යාපාරයේ දුර්වල මූල්‍ය තත්ත්වය හේතුවෙන් සේවකයන් කිහිපදෙනෙක් ස්වේච්ඡාවෙන් ම ඉල්ලා අස්විය.

(i) ව්‍යාපාරයේ මෙම තත්ත්වයට හේතු වූ **එක්** බාහිර සාධකයක් සඳහන් කරන්න.

..........................................................................................................

(ii) ව්‍යාපාරයේ මෙම තත්ත්වයට හේතු වූ **එක්** අභ්‍යන්තර සාධකයක් සඳහන් කරන්න.

..........................................................................................................

(G) සහල් මෝල් හිමිකරුවකු රුපියල් 150, 000 ක් වැයකර නව සහල් සැකසුම් යන්ත්‍රයක් මිලදී ගන්නා ලදී. ඔහු මේ සඳහා 1% මාසික පොලී පදනම මත රුපියල් 100, 000 ක බැංකු ණයක් ලබාගත් අතර, තවත් රුපියල් 20, 000 ක් වැයකර, එම යන්ත්‍රය ස්ථාපනය කරන ලදී. ඔහුගේ මාසික විදුලි බිල රුපියල් 12, 000 ක් වේ. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මෙම ව්‍යාපාරයේ ප්‍රාග්ධන ආයෝජනය කොපමණ ද?

..........................................................................................................

..........................................................................................................

(ii) මෙම ව්‍යාපාරයේ මාසික පුනරාවර්තන වියදම ගණනය කරන්න.

..........................................................................................................

..........................................................................................................

(iii) ව්‍යාපාරයේ ලාභ / අලාභ ගණනය කිරීම සඳහා අවශ්‍ය වන අතිරේක තොරතුරු **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(H) සුදුසු ව්‍යවසායකත්ව අවස්ථාවක් තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු සාධක **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(I) නියමිත ප්‍රමිති අනුගමනය කිරීමෙන් තොරව ආහාර සැකසීම නිසා ඇතිවිය හැකි අවදානම් තත්ත්ව සඳහා උදාහරණ **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(J) වෙළඳපොළ අපද්‍රව්‍ය හා කෘෂි අපද්‍රව්‍ය කොම්පෝස්ට් සැකසීම සඳහා යෝග්‍ය අමුද්‍රව්‍ය වේ. මෙම අමුද්‍රව්‍ය භාවිතයෙන් වඩාත් හොඳින් කොම්පෝස්ට් නිපදවීම සඳහා අවශ්‍ය වන තත්ත්ව **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................................


(2) ..........................................................................................................

මෙම තීරයේ කිසිවක් නො ලියන්න.

**3.** (A) හෙක්ටාර 1/4 ක වී වගාවක් සඳහා පහත එක් එක් ක්‍රියාකාරකම් වෙනුවෙන් යොදා ගත හැකි උචිත, විකල්ප තාක්ෂණ **එක** බැගින් දක්වන්න.

| ක්‍රියාකාරකම | උචිත විකල්ප තාක්ෂණය |
|---|---|
| (i) බිම් සැකැස්ම සඳහා රෝද හතරේ ට්‍රැක්ටරය භාවිතය | ................................................ |
| (ii) අස්වනු නෙළීමට සංයුක්ත අස්වනු නෙළන යන්ත්‍රය (Combine harvester) යොදා ගැනීම | ................................................ |

(B) පහත රූප සටහනින් ගොවිපොළ උපකරණයක් දැක්වේ.




(i) මෙම උපකරණය නම් කරන්න. ................................................

(ii) මෙම උපකරණය කෘෂිකර්මාන්තයෙහි දී යොදා ගන්නා ආකාරය විස්තර කරන්න.

................................................

................................................

................................................

................................................

(iii) උපකරණයෙහි පහත සඳහන් කොටස්වල කාර්යය සඳහන් කරන්න.

| කොටස | කාර්යය |
|---|---|
| (1) තැටිය | : ................................................ |
| (2) ඉහළ ඇඳුම | : ................................................ |

(C) භූමි හායනය සිදුවිය හැකි හේතුකාරක **හතරක්** දක්වන්න.

(1) ................................................

(2) ................................................

(3) ................................................

(4) ................................................

(D) විසිරි ජල සැපයුම් පද්ධතියක පහත දැක්වෙන එක් එක් කොටස්වල කාර්යය සඳහන් කරන්න.

| කොටස | කාර්යය |
|---|---|
| (i) වතුර පොම්පය | : ................................................ |
| (ii) ජල පෙරනය | : ................................................ |
| (iii) විසුරුම් හිස (Sprinkler head) | : ................................................ |

EXAMMOOD.LK

මේ තීරයේ කිසිවක් නො ලියන්න.

(E) පහත සඳහන් එක් එක් බෝග සඳහා සුදුසු ජල සැපයුම් ක්‍රමයක් බැගින් සඳහන් කරන්න.

| **බෝගය** | **ජල සැපයුම් ක්‍රමය** |
|---|---|
| (i) වී | : ............................................................ |
| (ii) අඹ | : ............................................................ |
| (iii) මිරිස් | : ............................................................ |

(F) (i) ශාක තුළ නයිට්‍රජන්වල කායික විද්‍යාත්මක කාර්යභාර **දෙකක්** සඳහන් කරන්න.

(1) ............................................................

(2) ............................................................

(ii) ශාකවල කැල්සියම් ඌනතා ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(1) ............................................................

(2) ............................................................

(G) ශාක සම්බන්ධ පහත ප්‍රකාශ නිවැරදි 'T' හෝ වැරදි 'F' දැයි සඳහන් කරන්න.

(i) පංජරය තුළ $CO_2$ තිර කිරීම සිදු වේ. : .........

(ii) ප්‍රභාසංස්ලේෂණයේ දී තිරවන සෑම $CO_2$ අණුවකටම එක් $O_2$ අණුවක් බැගින් නිපදවේ. : .........

(H) මාර්ග දෙපස සිටුවා ඇති ගස් හේතුවෙන් ඇතිවන ගැටලු **දෙකක්** සඳහන් කරන්න.

(1) ............................................................

(2) ............................................................

4. (A) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ, පහත් බිම් වී වගා කරන ගොවි මහතකු වී සිටුවා 7 වන දිනයේ දී වල් මර්දනය සඳහා වල් නාශකයක් භාවිත කිරීමට තීරණය කරයි. ඔහු පත්‍ර මතට ඉසින, දින 2 - 3 ක දී වල් මර්ධන ලක්ෂණ පෙන්නුම් කරන, වල් නාශකයක් මේ සඳහා තෝරා ගන්නා ලදී. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) පත්‍ර සහ කඳ සම්බන්ධ රූපීය ලක්ෂණ පදනම් කරගත් වල් පැළෑටි වර්ගීකරණයට අනුව, ගොවි මහතා විසින් මර්දනය සඳහා ඉලක්ක කරන ප්‍රධාන වල් පැළෑටි කාණ්ඩය කුමක් ද?

............................................................

(ii) ගොවි මහතා භාවිත කරන වල් නාශකය පහත උපමාන අනුව වර්ගීකරණය කරන්න.

(1) යොදන කාලය : ............................................................

(2) ක්‍රියාකාරිත්වය (Mode of action) : ............................................................

(iii) වල් නාශකය යෙදීමෙන් දින 2 - 3 කට පසු ගොවි මහතා විසින් කළ යුතු වැදගත් ක්‍රියාවක් සඳහන් කරන්න.

............................................................

(B) (i) රූපාන්තරණය යනු කුමක් ද?

............................................................


............................................................



EXAMMOOD.LK

මෙම තීරයේ කිසිවක් නො ලියන්න.

(ii) පහත රූප සටහනෙහි කෘමියෙකුගේ සම්පූර්ණ රූපාන්තරණය දැක්වේ. එහි A, B සහ C අවස්ථා නම් කරන්න.




A : ............................................

B : ............................................

C : ............................................

(C) ශ්‍රී ලංකාවේ පොලිතීන් ගෘහ තුළ බහුලව වගා කරන බෝග **හතරක්** නම් කරන්න.

(1) ............................................

(2) ............................................

(3) ............................................

(4) ............................................

(D) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ප්‍රධාන කැපූ මල් විශේෂ **දෙකක්** සහ ප්‍රධාන කැපූ පත්‍ර විශේෂ **දෙකක්** නම් කරන්න.

(i) කැපූ මල්

(1) ............................................

(2) ............................................

(ii) කැපූ පත්‍ර

(1) ............................................

(2) ............................................

(E) භූමි අලංකරණයේ දී තණකොළ සහිත පිට්ටනිවල වාසි **හතරක්** දක්වන්න.

(1) ............................................

(2) ............................................

(3) ............................................

(4) ............................................

(F) පහත ඡේදයේ ඇති හිස්තැන් පුරවන්න.

"............................................ වැනි ගෝචර තෘණ වර්ග ගවයින් සඳහා උලා කෑමට සුදුසු ය. රූමනයේ ජීවත්වන ............................................ මගින් දළ ආහාර ජීරණය කිරීමෙන් කිරි දෙනුන්ට අවශ්‍ය පෝෂක ලබා ගත හැකි වුවද, ඔවුන්ට ඛනිජ ද්‍රව්‍යවලට අමතරව ............................................ සහ ............................................ පරිපූරක අඩංගු සාන්ද්‍ර ආහාර මිශ්‍රණයක් ද සැපයිය යුතු ය."

මේ තීරයේ කිසිවක් නො ලියන්න.

(G) බිත්තර දමන වර්ගයේ කුකුළු පැටවුන් නිපදවීම සඳහා බිත්තර රක්කවනයක් තුළ කුකුළු බිත්තර 50,000 ක් තැන්පත් කරන ලදී. බීජෞෂණය අරඹා පළමු සතිය අවසානයේ දී සිදු කළ ආලෝක පරීක්ෂාවේ දී පැහැදිලි බිත්තර 2,000 ක් හඳුනා ගන්නා ලදී. රක්කවීම අවසානයේ දී කුකුළු පැටවුන් 40,000 ක් නිපදවූ නමුත් වෙළෙඳපොළට යැවීම සඳහා තෝරාගත හැකි වූයේ පැටවුන් 20,000 කට වඩා අඩු සංඛ්‍යාවකි.

(i) සඵල බිත්තරවල රක්කවීමේ හැකියාව (%) ගණනය කරන්න.

....................................................................................................

....................................................................................................

(ii) අවසානයේ දී වෙළෙඳපොළට යැවීම සඳහා පැටවුන් 20, 000 කට වඩා අඩු සංඛ්‍යාවක් පමණක් තෝරා ගැනීමට ප්‍රධාන හේතුව සඳහන් කරන්න.

....................................................................................................

....................................................................................................

(H) එළදෙනකගේ මද චක්‍ර යාමනය සඳහා හේතු වන හෝමෝන **දෙකක්** නම්කර, ඒ එක් එක් හෝමෝනයේ ප්‍රධාන කාර්යය සඳහන් කරන්න.

| | **හෝමෝනය** | **ප්‍රධාන කාර්යය** |
|---|---|---|
| (1) | .............................................. | .............................................................. |
| (2) | .............................................. | .............................................................. |

(I) පහත සඳහන් පරිරක්ෂණ ක්‍රම මගින් පරිරක්ෂණය කළ සත්ත්ව නිෂ්පාදන සඳහා උදාහරණ **දෙක** බැගින් සඳහන් කරන්න.

(1) ආසුැතික විජලනය : ....................................................................................................

(2) පැසවීම : ....................................................................................................

* *



EXAMMOOD.LK EXAMMOOD.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

කෘෂි තාක්ෂණවේදය II
விவசாயத் தொழினுட்பவியல் II
Agro Technology II

18 S II

## රචනා

※ B සහ C යන කොටස්වලින් එක් කොටසකින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලැබේ.)

## B කොටස

5. (i) ශ්‍රී ලංකාවේ සංවර්ධන වැඩසටහන් සඳහා සාම්ප්‍රදායික තාක්ෂණය භාවිතයේ වාසි සහ අවාසි සඳහන් කරන්න.
   (ii) අපද්‍රව්‍ය මගින් පරිසරයට සිදුවන හානිකර බලපෑම් විස්තර කරන්න.
   (iii) ජාතික ආහාර සුරක්ෂිතතාවයේ (Food security) වැදගත්කම සහ ඒ කරා ළඟා වීමට යොදා ගත හැකි උපක්‍රම පැහැදිලි කරන්න.

6. (i) නරක්වීම නිසා ආහාරයක සිදුවිය හැකි වෙනස්කම් පැහැදිලි කරන්න.
   (ii) පාසල් දරුවන් සඳහා පෝෂ්‍ය සම්පන්න ආහාර වේලක් සැලසුම් කිරීමේ දී සලකා බැලිය යුතු සාධක පැහැදිලි කරන්න.
   (iii) කිරි පරිරක්ෂණ ක්‍රමවේද විස්තර කරන්න.

7. (i) "ඉහළ ආහාර නිෂ්පාදනයක් කරා ළඟාවීමට ජෛව තාක්ෂණ යෙදුම් ප්‍රබල දායකත්වයක් සපයා ඇත." මෙම ප්‍රකාශය සාධාරණීකරණය කරන්න.
   (ii) හොඳ ව්‍යවසායකයකු සතු ගතිලක්ෂණ විස්තර කරන්න.
   (iii) ආහාර නිෂ්පාදනයේ දී යන්ත්‍ර සූත්‍ර භාවිතය නිසා සිදුවන පාරිසරික හානි අවම කරගත හැකි ආකාරය විස්තර කරන්න.

## C කොටස

8. (i) හෙක්ටාර් 1 ක උස් බිමක ගොවිතැන් කිරීමේ දී බිම් සැකැසීම සඳහා උචිත තාක්ෂණ සංයෝජනයක් භාවිත කළ හැකි ආකාරය විස්තර කරන්න.
   (ii) 'මෑඳු හූ දර්ශන ද්‍රව්‍යවල' වැදගත්කම පැහැදිලි කරන්න.
   (iii) පහත් බිම් වී වගාවක පාංශු නිෂ්පාදකතාව තිරසාර අයුරින් දියුණු කිරීමට යොදාගත හැකි ක්‍රම විස්තර කරන්න.

9. (i) කෘෂිකර්මාන්තයේ දී රෝපණ ද්‍රව්‍ය ගුණනය කර ගැනීමට පටක රෝපණය යොදා ගැනීමේ ඇති වාසි සහ අවාසි පැහැදිලි කරන්න.
   (ii) වී වගාවකට පොස්පරස් සහ පොටෑසියම් පොහොරවල ඇති වැදගත්කම විස්තර කරන්න.
   (iii) බෝගවල නිෂ්පාදකතාව වැඩි දියුණු කිරීම කෙරෙහි පාරිසරික උෂ්ණත්වයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

10. (i) කුඹුරක පළිබෝධනාශක භාවිතයේ ඇති පාරිසරික බලපෑම පැහැදිලි කරන්න.
    (ii) සුදුසු දළ සටහන් භාවිත කර, සූර්ය ප්‍රචාරක ව්‍යූහයක් සාදා ගත හැකි ආකාරය විස්තර කරන්න.
    (iii) උපරිම රැක්කවීමේ ප්‍රතිශතයක් ලබා ගැනීම සඳහා බිත්තර රක්කවනයක් පාලනය කරන ආකාරය විස්තර කරන්න.

* * *